# සංස්කරණ ප්‍රතිපත්තිය

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය වූ කලී විමර්ශිත සඟරාවකි. ඕනෑ ම විෂය ක්ෂේත්‍රයකට අදාළ ව සිංහල භාෂාවෙන් රචිත, පුරෝගාමී ඥානයක් සම්පාදනය කෙරෙන, උසස් ප්‍රමිතියෙන් යුතු ලිපි මෙහි පළ කෙරේ. සියලු ම ලිපි ප්‍රවීණ විමර්ශන මඬුල්ලකට යොමු කෙරෙන අතර ආරාධිත ජ්‍යෙෂ්ඨ පර්යේෂකයන්ගේ ලිපි, සංස්කාරක මණ්ඩලයේ විමර්ශනයට පමණක් යොමු කෙරේ. සඟරාවේ පළ කෙරෙන ලිපිවල අන්තර්ගතය පිළිබඳ වගකීම ඒ ඒ ලේඛකයන් සතු ය.

## උපදෙස් පත්‍රිකාව

(1) සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය, විමර්ශිත සඟරාවක් (Refereed Journal) වන අතර, ඒ සඳහා ඕනෑ ම විෂයකින් සිංහල භාෂාවෙන් පමණක් ලියැවුණු ලිපි භාර ගැනේ.

(2) ඉදිරිපත් කරනු ලබන ලිපි A4 පිටු 20 ක උපරිමයකින් සමන්විත විය යුතු අතර වචන **250** කට නොවැඩි **සිංහල සහ ඉංග්‍රීසි** බසින් රචිත සාරසංක්ෂේපයක් (Abstract) සහිත ව ඉදිරිපත් කළ යුතු ය.

(3) සාරසංක්ෂේපය (Abstract) කේන්ද්‍රීය වචන (Key Words) පහක් සහිත ව සිංහල සහ ඉංග්‍රීසි බසින් ඉදිරිපත් කළ යුතු ය. ඉංග්‍රීසි භාෂාව සඳහා **MS Word Times New Roman** එකොළහ (Font Size-**11**) යන අක්ෂර ප්‍රමිතීන් භාවිත කළ යුතු ය. සාරසංක්ෂේපය ලිවීමේ දී පේළි අතර ඒකාවකාශයක් (Single-space) තිබිය යුතු ය.

(4) මෙම ශ්‍රාස්ත්‍රීය සංග්‍රහයෙහි පළ කිරීම සඳහා ඉදිරිපත් කෙරෙන ළිපි පහත පරිදි ව්‍යුහගත කළ යුතු ය.

(i) පර්යේෂණ මාතෘකාව
(ii) කර්තෘ නාමය සහ විද්‍යුත් ලිපිනය
(iii) කේන්ද්‍රීය වචන (Key Words) පහක් සහිත ව ඉංග්‍රීසි සහ සිංහල බසින් සකස් කරන ලද සාරසංක්ෂේපය (Abstract)
(iv) හැඳින්වීම
(v) සාහිත්‍ය විමර්ශනය
(vi) පර්යේෂණ ගැටලුව
(vii) පර්යේෂණ අරමුණු
(viii) පර්යේෂණයේ වැදගත්කම
(ix) පර්යේෂණ ක්‍රමවේදය
(x) දත්ත විශ්ලේෂණය
(xi) නිගමනය
(xii) පරිශීලිත මූලාශ්‍රය

(5) ලිපි පරිගණක යතුරු ලියනය කළ යුතු ය. ඒ සඳහා Microsoft Word, **FM Abhaya** 11 (Font size - **11**) යන අක්ෂර ප්‍රමිතීන් භාවිත කළ යුතු වන අතර A4 ප්‍රමාණයේ කොළයක පේළි අතර ද්විත්වාවකාශයක් (Double-space) තිබීම අවශ්‍ය වේ.

(6) මාතෘකා හා අනුමාතෘකා කෙටි හා පැහැදිලි විය යුතු අතර තද කළු අකුරෙන් විය යුතු ය.

(7) උපුටා ගැනීම් ඒකාවකාශ (Single-space) විය යුතු ය. එසේ ම එහි දී එම උපුටා ගැනීමට, උපුටා ගැනීමේ ලකුණ තිබීම අත්‍යවශ්‍ය වේ.

(8) සිංහල නොවන පද කළු අකුරෙන් තිබිය යුතු ය.

(9) (9) ලේඛනයේ දී “ප්‍රතිශතය” හෝ අදාළ ලකුණ (%) යන්න යොදා ගත යුතු ය. එකේ සිට දහය දක්වා වන ඉලක්කම් සඳහා අකුරු භාවිත කළ යුතු වන අතර 11 සිට ඉහළට අංකයන් ය. එහෙත් අංක පිළිවෙළක දී නිරන්තරයෙන් අංක හෝ අකුරු භාවිත කිරීම අවධාරණය කෙරේ. උදා: 5 සිට 10.

(10) වගුවල මාතෘකා අදාළ වගුවට ඉහළින් දැක්විය යුතු ය. ඒ සඳහා වන මූලාශ්‍රය හෝ සටහන් වගුවට පහතින් සඳහන් කළ යුතු ය.

(11) රූප සටහන්වල මාතෘකා අදාළ රූපසටහනට පහළින් දැක්විය යුතු ය. ඒ සඳහා වන මූලාශ්‍රය ද ඒ සමග ම යෙදිය යුතුවේ.

(12) වගු හෝ රූප සටහන් වෙන වෙන ම පිළිවෙළින් අංකනය කළ යුතු ය. තීරු මාතෘකා මගින් ඉදිරිපත් කළ දත්තයන් මනා ව දැක්විය යුතු ය.

(13) Ms Word වපසරියකින් ප්‍රතිනිර්මාණය කළ නොහැකි රූප වෙන ම A4 කොළයක ඉදිරිපත් කළ යුතු වන අතර ඒවාහි මාතෘකා පිළිබඳ තොරතුරු සටහන් මූලාශ්‍රය හා ලේඛනයෙහි ඒවාට හිමි නියම ස්ථානය ද පිළිබඳ විස්තර ද ඒ සමග විය යුතු ය.

(14) මූලාශ්‍රය සටහන් ඉදිරිපත් කිරීම, **හාවර්ඩ් ශෛලිය** හෙවත් පෙළ තුළ ම උපුටා දැක්වෙන කර්තෘ - වර්ෂ ක්‍රමය (Author-year) පමණක් භාවිත කළ යුතු ය.

**විමර්ශන සටහන් හෝ මූලාශ්‍රය සටහන් යෙදීම**

ඔබගේ ලිපියේ සඳහන් වන විමර්ශන සටහන් සියල්ල ලිපිය අවසානයේ යෙදෙන පරිශීලිත මූලාශ්‍රය නාමාවලියේ දී නිරවුල් ව තහවුරු විය යුතු ය.

ලිපිය තුළ කෙරෙන විමර්ශන සටහන් යෙදීම පිණිස කර්තෘ වර්ෂ ක්‍රමය පමණක් භාවිත කරන්න.

නිදර්ශනඃ

(i) ඒක කර්තෘක ග්‍රන්ථ සඳහා;

(වික්‍රමසිංහ 1956ඃ 128)

(Althusser 1978:39)

(ii) ද්විත්ව කර්තෘක ග්‍රන්ථ සඳහා;

(ද සිල්වා සහ ලියනගේ 2001ඃ 73)

(Wijesinghe and Kariyawasam 1985: 64)

(iii) බහු කර්තෘක ග්‍රන්ථ සඳහා;

(අභයසුන්දර සහ තවත් අය 1985ඃ 312)

(Arangala and etal 1991: 82)

(iv) ශබ්දකෝෂ හෝ විශ්වකෝෂ සඳහා;

(ශ්‍රී සුමංගල ශබ්දකෝෂය 1956ඃ 151)

(Oxford Dictionary 2001: 10)

(Encyclopaedia Britannica 1998: 65)

(v) ප්‍රාථමික මූලාශ්‍රයන් සඳහා;

(මහාවංස 1958: 110)

(ශ්‍රී ලංකා මහබැංකු වාර්තාවථ 2010)

(vi) පුද්ගල සම්මුඛ සාකච්ඡා සඳහා;

(කිරිමුදියන්සෙ: 2011.01.01)

(vii) පුවත්පත් ලිපි සඳහා;

(රාවය 2010.12.31)

(Daily News 31.12.2010)

(viii) ලිපි සංග්‍රහයන්/ සංස්කරණයන් සඳහා;

ලිපිය ලියූ ලේඛකයාගේ නාමය යොදා ගැනේ. සංස්කාරකවරයාගේ නාමය නොවේ.

(විතානගේ 1995: 63)

(Rupasinghe 2005: 28)

(ix) වෙබ් අඩවි හෝ අන්තර්ජාලයීය මූලාශ්‍රයන් සඳහා;

(Jayathilake 2008)

(x) ද්විතීයික මූලාශ්‍රයන් සඳහා;

(Cited in Oldenburg 1882: 230)

(15) සියලු ම උපුටාගැනීම් සහ වෙනත් මූලාශ්‍රයන් කතුවරුන්ගේ බුද්ධිමය දේපළ මනා ව තහවුරු කරමින් සඳහන් කළ යුතු ය.

(16) එක ම වසරක් තුළ පළ වූ එකම කතුවරයෙකුගේ කෘති දෙකක් වෙන්කර හඳුනාගැනීම සඳහා හැඟවුම් අක්ෂර යොදා ගන්න.

(කාරියවසම් 2002 අ: 61)

(කාරියවසම් 2002 ආ: 35)

(17) ආශ්‍රිත මූලාශ්‍රය නාමාවලිය, රූප සටහන් හා වගු අකාරාදි පිළිවෙළට වෙනවෙන ම පිටුවල සඳහන් කළ යුතු ය.

(i) ග්‍රන්ථ සඳහා;

ගම්ලත්, සුචරිත (1985) සාහිත්‍ය කලා ආදිය ගැන, කොළඹ, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

Marx, K. and Engles, F (2002) Communist Manifesto, London, Penguin.

(ii) ශබ්දකෝෂ හෝ විශ්වකෝෂ සඳහා;

ශ්‍රී සුමංගල ශබ්දකෝෂය (1956) සෝරත, වැලිවිටියේ (සංස්) ගල්කිස්ස, අභය ප්‍රකාශකයෝ.

(iii) ප්‍රාථමික මූලාශ්‍රයන් සඳහා;

මහාවංසය (1958) බුද්ධදත්ත, පොල්වත්තේ (පරි) ගල්කිස්ස, අභය ප්‍රකාශකයෝ.

ශ්‍රී ලංකා මහාබැංකු වාර්තාව (2010) කොළඹ, ශ්‍රී ලංකා මහාබැංකුව.

(iv) පුද්ගල සම්මුඛ සාකච්ඡා සඳහා;

කිරිමුදියන්සෙ, හේරත් හාමිලාගේ (71) 2011-01-01, "වනස්පති", සොරොව්ව පාර, මපාකඩවැව.

(v) පුවත්පත් ලිපි සඳහා;

රාවය 2010.12.31, ගුණරත්නල හේමාල්, "අයවැය ප්‍රායෝගික නෑ" මහරගම, රාවය ප්‍රකාශකයෝ.

(vi) ලිපි සංග්‍රහයන්/ සංස්කරණයන් සඳහා;

ආරියරත්න, මනෝජ් (2003) "19 වන සියවසේ ශ්‍රී ලංකාවේ ආගමික ප්‍රබෝධය හා සංස්කෘතික අනන්‍යතාව" සුගුණධම්ම, නාවින්නේ හා තවත් අය (සංස්:) වැලම්ටියාවේ කුසලධම්ම ප්‍රශස්ති, කොළඹ, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

(vii) ද්විතයික මූලාශ්‍රයන් සඳහා;

Althusser, Louis (1982) Lenin and Philosophy and other Essays, London, Verso.

(18) ලිපියෙහි මෘදු පිටපතක් (a soft copy) පහත සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කළ යුතු ය. sjseditor@crkd.sab.ac.lk

(19) සෑම ලිපියක් ම සමඟ ලේඛක භවතාගේ තොරතුරු; මේ සමඟ ඇති පෝරමයේ පුරවා ඉදිරිපත් කළ යුතු ය. (මෙකී පෝරමය අප විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියෙන් ද උපුටාගත හැකි ය).

ලිපි එවිය යුතු ලිපිනයඃ

ප්‍රධාන සංස්කාරක,

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය,

පර්යේෂණ හා දැනුම ව්‍යාප්ත කිරීමේ ඒකකය,

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය,

බෙලිහුල්ඔය,

දූරකථනයඃ 045-2280013

විද්‍යුත් ලිපිනයඃ sjseditor@crkd.sab.ac.lk